**අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 05 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන ප්‍රකාරව, කාරෙයිතිවු, සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවලින් සහ කල්මුනෙයි සහ අක්කරෙයිපත්තු මහ නගර සභාවලින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය භාවිතා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු සේවා ගාස්තු රු.3,511,874 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.1,572,756 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.1,939,118 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් මිලදී ගෙන තිබූ රු.49,675 ක් වටිනා පුස්තකාල පොත් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී විනාශ කළ පුස්තකාල පොත් 614 කට අදාල වටිනාකම ලේඛනවල ගැලපීම් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පළාතට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර යටතේ ලැබී ඇති ට්‍රැක්ටර ට්‍රේලරයේ වටිනාකම වන රු.300,000 ගිණුම්වලට ගෙන නොතිබුණි.

#### 1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

2005 වර්ෂයේදී සභාවට අයත් විදුලි උපකරණ ලංකා විදුලිබල මණ්ඩලයට ලබාදීම සම්බන්ධයෙන් මණ්ඩලයෙන් ලැබිය යුතු රු.350,322 ක වටිනාකම අයකර ගැනීමට හෝ ලේඛනවලින් ඉවත්කිරීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගොඩනැගිලි | 15,408,927 | ස්ථාවර වත්කම් ලේඛනය |
| ලී බඩු උපකරණ හා සවිකිරීම් | 189,815 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 89,590 | |
| ණයහිමියෝ | 316,421 | ශේෂ සනාථ කිරීමේ ලිපි |

**1.3.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.322,850 ක් වන පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2005 වර්ෂයේදී අතුරුදහන් වූ රු.96,392 ක් වටිනා විදුලි උපකරණ සහ 2015 දෙසැම්බර් 20 දින සොරකම් කරන ලද රු.170,000 ක් වටිනා සූර්ය බල ශක්තියෙන් ක්‍රියාකරන විදුලි බල්බ 02 සහ සවිකිරීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්ම වූ එකතුව රු.6,861,073 ක් වටිනා ඉකුත් තැන්පතු 70 ක් අදාල පුද්ගලයන්ට ලබාදීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 6,121,136 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත්

වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,004,126 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,117,010 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 ආදායම් පරිපාලනය

--------------------------

### 2.2.1 ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම

------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (VII)(ඊ) වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශ තුළ පුද්ගලික ආයතන විසින් ඔවුන්ගේ විකුණුම් ද්‍රව්‍ය ප්‍රචාරණය කිරීම සඳහා ස්ථාපිත කළ දැන්වීම් පුවරු 40 ක බලපත්‍ර ගාස්තු රු.442,650 ක් අයකර ගෙන නොතිබුණි.

### 2.2.2 මාළු වෙළඳපොල බදු අයකර ගැනීම

-------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මාළු වෙළඳපොල හිඟ බදුකුලී රු.32,000 ක් වර්ෂයක කාලයක සිට අයකර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 2.2.3 ගව හම් විකුණුම් ආදායම

------------------------------

සමාලෝචිත වර්ෂයේ ගව ඝාතකාගාරයේ මස් පිණිස ගවයින් 3,328 ක් ඝාතනය කර තිබුණු නමුත් ඒවායේ සම්, සම් භාණ්ඩ නිෂ්පාදනය කරන නිෂ්පාදක ආයතනවලට විකිණීමට කටයුතු නොකර තනි පුද්ගලයෙකුට නොමිලේ ලබාදී තිබීම හේතුවෙන් සභාවට රු.499,200 ක ආදායමක් අහිමි වී තිබුණි.

### 2.2.4 ඝන අපද්‍රව්‍ය සේවා ගාස්තු අයකිරීම

-------------------------------------

සභා බල ප්‍රදේශයට අයත් නිවාස, කඩ කාමර හා පුද්ගලික ආයතනවලින් එකතුවන ඝන අපද්‍රව්‍ය සඳහා සේවා ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේදී ආසන්න වශයෙන් රු.4,849,750 ක මුදලක් අය කරගැනීමට සැලසුම් කර තිබුණත් රු.807,010 ක මුදලක් පමණක් සභාව විසින් අයකර ගෙන තිබුණි.

### 2.2.5 මස්කඩ බදු අයකිරීම

--------------------------

2016 දෙසැම්බර් 31 දින වන විට පැවැති මස්කඩ බදු කුලී රු.273,300 ක මුදල වර්ෂ හතරක කාලයක සිට අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවතුණි.

### 2.2.6 මුද්දර ගාස්තු අයකිරීම

------------------------

පළාත් සභා ප්‍රධාන ලේකම්වරයාගෙන් 2014 සහ 2015 වර්ෂ සඳහා වන මුද්දර ගාස්තු රු.6,682,374 ක මුදල 2017 සැප්තැම්බර් 26 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් ආයතනවලින් තෑගි ලෙස ලැබී තිබුණු වාහන 05 ක් වර්ෂ 07 කට අධික කාලයක සිට සභාව විසින් භාවිතා කරනු ලැබූ නමුත් එම වාහන සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ පළාත් සභා සඳහා වෙන්කරන ලද සංවර්ධන සහනාධාර යටතේ ලැබී තිබුණු රු.1,400,000 ක මුදල උපයෝගී කර පල්ලක්කාඩු ග්‍රාමයේ ඉදිකරන ලද සතුන්ගේ ඇටකටු

ඇඹරීමේ මධ්‍යස්ථානය සහ ඒ සඳහා මිලදී ගනු ලැබූ යන්ත්‍රෝපකරණ භාවිතා කිරීමට කටයුතු නොකිරීම නිසා 2017 සැප්තැම්බර් 26 දින වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි.

(ඇ) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් වර්ග 35 කට අයත් වත්කම් 238 ක ඌනතාවයක් පෙන්නුම් කර තිබුණත් ඒ සම්බන්ධයෙන් 2017 සැප්තැම්බර් 26 දින වන විටත් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ “පළාත් නැඟුම” වැඩසටහන යටතේ අඬ්ඩාලච්චේනෙයි වෙරළ ළමා උද්‍යානය සමාලෝචිත වර්ෂයේදී රු.3,073,763 ක වියදමින් ඉදිකර තිබුණි. එසේ වුවද, ඇස්තමේන්තුවේ ඇතුළත්ව තිබුණු වැසිකිලි පහසුකම්, ප්‍රධාන දොරටු, පානීය ජල පහසුකම්, විදුලිබල පහසුකම්, සෙවන ලබාදිය හැකි ගස් වර්ග සහ ආසන පහසුකම් යන කාර්යයන් මේ දක්වා ඉටුකර නොතිබීම හේතුවෙන් මෙම උද්‍යානය භාවිතා කරන මහජනතාවට මහත් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු වී තිබුණි.

**4. පද්ධති හා පාලන**

------------------

පහත දැක්වෙන පද්ධති හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | i ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>ii නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | i ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම.<br>ii ඝන අපද්‍රව්‍ය සේවා ගාස්තු අයකර ගැනීම. |